# කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය
# கொம்ப்ரோலர் ஜெனரல் அலுவலகம்
# Comptroller General's Office

## මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
## நிதி, பொருளாதார நிலைப்படுத்தல் மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
## Ministry of Finance, Economic Stabilization and National Policies

මහලේකම් කාර්යාලය, කොළඹ 01
செயலகம் , கொழும்பு 01
The Secretariat, Colombo 01

කොම්ප්ට්‍රොලර් ජනරාල්
கொம்ப்ரோலர் ஜெனரல் 0112151452
Comptroller General

පොදු
பொது 0112151425
General

ෆැක්ස්/ தொலைநகல் / Fax : 0112151417
Web Site : www.treasury.gov.lk
E-Mail : cgo@mo.treasury.gov.lk


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No | CGO/ASM/Policy/Cir/(Vol.II) | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | |
| දිනය<br>திகதி<br>Date | 2022.09.09 | | |

**වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක : 10/2022**

සියලුම : අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
රාජ්‍ය බැංකු සහ රාජ්‍ය සමාගම් සභාපතිවරුන්

**රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය**

**රාජ්‍ය ආයතනවල ගොඩගැසී ඇති අබලි ද්‍රව්‍ය අපහරණය කිරීම**

රජයේ දේපළ විනාශවීම සහ රජයේ ආදායම අහිමි වීම වැළැක්වීම සඳහා රාජ්‍ය ආයතනවල දීර්ඝ කාලයක් තුළ ගොඩගැසී ඇති අබලි ද්‍රව්‍ය අපහරණය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට 2022 - අතුරු අයවැය මඟින් යෝජනා කර ඇත. තවද, අබලි ද්‍රව්‍ය අපහරණය කිරීම තුළින් සෞඛ්‍යාරක්ෂිත පරිසරයක් ගොඩනැගෙන අතර පවත්නා ඉඩපහසුකම් ඵලදායීව යොදා ගැනීමට හැකිවනු ඇත. ඒ අනුව, එවැනි අබලි ද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීම තහවුරු කිරීම සඳහා ජනාධිපති ලේකම් විසින් කමිටුවක් පත්කර ඇත.

02. ඒ අනුව, පහත සඳහන් පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සියළුම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්ගේ අනිවාර්යය කාර්යයක් වන බව අවධාරණය කරමි:

අ). පහත 02 (ඇ) II,III සහ IV යටතේ දක්වා ඇති අබලි ද්‍රව්‍යවල වටිනාකම තක්සේරු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු, තාක්ෂණික දැනුම සහිත නිලධාරියෙකු සහ වෙනත් රජයේ ආයතනයක නිලධාරියෙකු යන අයගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් සෑම ආයතනයක් විසින්ම පත් කිරීම.

ආ). පහත 02 (ඇ) II,III සහ IV යටතේ දක්වා ඇති අබලි ද්‍රව්‍ය පිළිබඳව 2022 සැප්තැම්බර් 15 දිනට අදාල වන, මේ සමඟ වන ඇමුණුම 1 මගින් ඉල්ලා ඇති තොරතුරු, 2022 ඔක්තෝම්බර් 15 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.

ඇ). පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරමින් අබලි ද්‍රව්‍ය අපහරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම

| අංකය | අබලි ද්‍රව්‍ය වර්ගය | ගතයුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| I. | වාහන (ලියාපදිංචි කල) | 2020 ඔක්තෝම්බර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 මගින් ලබා දී ඇති උපදෙස් අදාල වේ. |
| II. | යකඩ හා වානේ | මූ.රෙ. 773 (1) හි ප්‍රතිපාදන අනුව අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම |
| III. | පිත්තල, තඹ, ඇලුමිනියම්, වීනච්චට්ටි හෝ වෙනත් ලෝහමය ද්‍රව්‍ය | මූ.රෙ. 773 (2) හි ප්‍රතිපාදන අනුව අබලි ද්‍රව්‍ය රජයේ කර්මාන්ත ශාලාව වෙත භාරදීම |
| IV. | දැව, ප්ලාස්ටික් හා වෙනත් | මූ.රෙ. 772 හි ප්‍රතිපාදන අනුව අබලි ද්‍රව්‍ය අපහරණය කිරීම |

ඇ). ඉහත 02 (ඇ) යටතේ දක්වා ඇති අබලි ද්‍රව්‍ය අපහරණය කිරීම පිළිබඳ ප්‍රගතිය 2022 නොවැම්බර් 30 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම

| අංකය | අබලි ද්‍රව්‍ය වර්ගය | ප්‍රගතිය වාර්තා කිරීම |
|---|---|---|
| I. | ඉහත 02 (ඇ) (I) හි විස්තර කර ඇති අබලි ද්‍රව්‍ය | 2020 ඔක්තෝම්බර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 මගින් ලබා දී ඇති උපදෙස් අදාල වේ. |
| II. | ඉහත 02 (ඇ) (II),(III) සහ (IV) හි විස්තර කර ඇති අබලි ද්‍රව්‍ය | මේ සමඟ වන ඇමුණුම II අනුව |

03. අබලි ද්‍රව්‍ය අපහරණය මගින් ලැබෙන ආදායම් පහත සඳහන් පරිදි ගිණුම්ගත කල යුතුවේ:

අ). අයවැය ශීර්ෂයක් සහිත ආයතනවල පවතින වාහන අබලි ද්‍රව්‍ය අපහණය කිරීමෙන් ලැබෙන ආදායම්, ආදායම් සංකේත 20.06.02.01 යටතේ ද, අනෙකුත් අබලි ද්‍රව්‍ය අපහරණය කිරීමෙන් ලැබෙන ආදායම්, ආදායම් සංකේත 20.06.02.02 යටතේ ද, ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුවේ.

ආ). අයවැය ශීර්ෂයක් නොමැති නමුත් රේඛීය අමාත්‍යාංශයක් හරහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබන ආයතනවල එවැනි ආදායම්, අදාල රේඛීය ආමාත්‍යාංශය හරහා ඉහත 03 (අ) හි දක්වා ඇති අදාල ආදායම් සංකේතාංක යටතේ ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුවේ.

ඇ). පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල එවැනි ආදායම් ඔවුන්ගේ අදාල අරමුදල්වලට බැර කල යුතුවේ.

04. නෛතික විමර්ශණයකට හෝ අධිකරණ නියෝගයකට යටත්වන අබලි ද්‍රව්‍ය පිළිබඳව, 2022 සැප්තැම්බර් 15 දිනට අදාල වන තොරතුරු ඇමුණුම 1 අනුව සම්පූර්ණ කර වෙනම 2022 ඔක්තෝබර් 15 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කලයුතු වන නමුත්, එවැනි අබලි ද්‍රව්‍ය සඳහා මෙම චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස් අදාල නොවේ.

05. තවද, ඈවර කිරීම සඳහා හඳුනාගත් හෝ ඈවර කිරීමේ ක්‍රියාවලිය යටතේ පවතින රාජ්‍ය ආයතන සඳහා මෙම චක්‍රලේඛයේ උපදෙස් අදාල නොවේ. එසේ වුවද, 2022 සැප්තැම්බර් 15 දිනට පවතින අදාල අබලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන තොරතුරු ඇමුණුම 1 අනුව සම්පූර්ණ කර වෙනම 2022 ඔක්තෝබර් 15 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුවේ.

06. ඔබගේ ආයතනයේ අබලි ද්‍රව්‍ය කිසිවක් නොමැති නම් හිස් වාර්තාවක් (Nil report) ඉදිරිපත් කල යුතුවේ.

07. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඇමුණුම I හා ඇමුණුම II විද්‍යුත් තැපැල (cgo@mo.treasury.gov.lk) මඟින්, ඉහත සඳහන් නියමිත දිනවලට පෙර, කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුවේ.

**අත්.කළේ/ කේ. එම්. මහින්ද සිරිවර්ධන**

**භාණ්ඩාගාර ලේකම්**

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති